ලිංගික අපරාධයකට ලක් වන බාලවයස් දරුවෙකුගේ හෝ දැරියකගේ අනන්‍යතාවය කෙසේ වත් හෙළි වීමට ඉඩ නොතැබිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේ අවධාරණය කෙරේ. මෙහිදී ලිංගික අපරාධයකට ලක්වූ බාලවයස්කරුවෙකුගේ අනන්‍යතාවය හෙළිවිය හැකි විවිධ ආකාර තිබේ. යම් හෙයකින් තමන්ට ඥාතිත්වයක් ඇති අයෙකු අතින් බාලවයස් දරුවෙකුට/දැරියකට ලිංගික අපරාධයක් සිදුවූ විටකදී, එම බාලවයස්කරුගේ සහ සැකකරුගේ/අපරාධකරුගේ ඥාතීත්වයත්, එම සැකකරුගේ/අපරාධකරුගේ අනන්‍යතාවයත් හෙළි කිරීම ඔස්සේ, බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය හෙළි වීම සිදුවිය හැක.
එවන් අවස්ථාවන්හිදී සැකකරුගේ/අපරාධකරුගේ අනන්‍යතාවය හෙළි නොකරන ලෙසින් මාධ්‍ය වෙත උපදෙස් ලබා දෙන්නේ ඒ හෙයිනි.
කෙසේ නමුත්, අරුණ පුවත්පත (07/21) එම වගකීම පැහැර හරිමින් පුවත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාවේ ප්‍රමුඛතාවය වන්නේ මනුෂ්‍ය ඝාතනයක් වුවත්, ලිංගික අපරාධයට ලක්වූ බාලවයස්කාර වින්දිතයා එම සැකකරුට දක්වන ඥාතීත්වයත්, සැකකරුගේ අනන්‍යතාවයත් එහි පැහැදිලිවම දක්වා තිබේ.
මෙය බැරෑරුම සැලකිල්ලට ගත යුතු මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව අපි මෙසේ අවධාරණයෙන් සඳහන් කරමු.
#MediaEthicsSL #lka #sinhalanews #Aruna